# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1767/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 27/11/2024<br>පැය 2205 |

**මාධ්‍ය නිවේදනය**

**නවීකරණය කළ SRI LANKA POLICE නිල වෙබ් අඩවිය හඳුන්වාදීම. - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී ලංකා පොලිස් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කර නව මුහුණුවරකින් නිර්මාණය කර මහජනතාවගේ පරිශීලනය සඳහා 2024.11.27 වන දින සවස බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ පිහිටි මහජන ආරක්ෂක අමාත්‍යාංශයේදී ගරු මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාල මහතාගේ ප්‍රධානත්වයෙන් එළි දක්වන ලදී.

ශ්‍රී ලංකා පොලිසියේ නව වෙබ් අඩවිය www.police.lk වෙත පිවිසීමෙන් පරිශීලනය කළ හැකි වන අතර, පොලිස් මාධ්‍ය කොට්ඨාසය විසින් සකසනු ලබන ශ්‍රී ලංකා පොලිසියේ තොරතුරු, විශේෂ අවස්ථා, පුවත්, ඡායාරූප, වීඩියෝවන් ඇතුළු විශේෂාංග රැසක අන්තර්ගතයක් සමඟ නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට නියමිත මෙම නව වෙබ් පිටුව පොලිස් තොරතුරු තාක්ෂණ කොට්ඨාසයේ නිර්මාණයකි.

එමෙන්ම සුපුරුදු පරිදි පොලිස් නිශ්කාෂණ වාර්තා සඳහා අයදුම් කිරීම, මාර්ගගත ක්‍රමය ඔස්සේ පැමිණිලි ඉදිරිපත් කිරීමට මෙම නව වෙබ් පිටුව හරහාද අවස්ථාව ලබාදී ඇති අතර, ඉදිරියේදී ඔබේ පහසුව උදෙසා පොලිස් තොරතුරු තාක්ෂණ කොට්ඨාසය විසින් සකසන ලද තවත් තාක්ෂණික අංග රැසක් මෙම නව වෙබ් පිටුව තුල ඇතුලත් කිරීමට නියමිතය.

ගරු මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍ය නීතීඥ සුනිල් වටගල මහතා, මහජන ආරක්ෂක පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් රවී සෙනෙවිරත්න මහතා, වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය, පොලිස් මාධ්‍ය ප්‍රකාශක හා අපරාධ දිසාව නියෝජ්‍ය පොලිස්පති නීතීඥ නිහාල් තල්දූව, පොලිස් තොරතුරු තාක්ෂණ කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අශෝක ධර්මසේන, පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරි මිනුර සෙනරත් යන මහත්වරුන් රැසක් මෙම අවස්ථාව සඳහා සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්


SRI LANKA POLICE
ENGLISH
Home
About Us
Divisions
Downloads
Library
Search
News
E-Services
Clearance Reports, Report your Complaints
Media
Press Releases, News Updates, Events & More.
Gallery
Image & Video Collection
Contact Us
Telephone, Police Stations & etc.
Join Us
Become a Guardian of Peace
SPECIAL EVENTS
Training on the INTERPOL Notices and Diffusions System
GRADUATION CEREMONY - 2024
Three officers from Interpol headquarters to meet CID officials
Convocation of the Degree Programme, 'National Security and Strategic Studies'
Inspector General of Police holds discussion with the officers of National Child Protection Authority
New Police Station, Kalkuda declared open for the general public
NOTABLE SERVICES







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**